FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

**2021 අප්‍රේල්**

කලාප අංක 04




**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම් හා පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන්/පසු විපරම් සම්බන්ධ කෙටි වාර්තාකරණයක් සහ ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම් කෙරෙහිද මෙහිදී අවධානය යොමු කර ඇත. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට/ සංරචකයන්ට අදාළ නව සිදුවීම් 09ක් 2021 අප්‍රේල් මාසය තුළ නිරීක්ෂණය විය. සිදුවීම් දෙකකට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් ප්‍රවෘත්ති නිවේදන නිකුත් කරන ලදි. තවත් සිදුවීමක් සම්බන්ධයෙන් මාධ්‍ය සංවිධාන එකතුව ලෙස නිවේදනයක් නිකුත් කර ඇත.**

## අප්‍රේල් මාසය තුළ වාර්තා වූ නව සිදුවීම්

1. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම්වල කටයුතු ආවරණය කිරීමට ජනමාධ්‍යවේදීන්ට තිබූ අයිතිය චක්‍රලේඛයක් මගින් අහිමි කිරීම.
2. උද්ඝෝෂණයක් වාර්තා කරමින් සිටියදී නිදහස් මාධ්‍යවේදී මලික අබේකෝන් අත්අඩංගුවට ගැනීම හා අත්අඩංගුවේ සිටියදී පහරදීම.
3. දෙමළ භාෂා ගුරුවරයකු හා කවියකු වන මුහම්මදු අහ්නාෆ් මුහම්මදු ජසීම් ත්‍රස්ත විමර්ශන අංශය මගින් අත්අඩංගුවට ගෙන වසරකට ආසන්න කාලයක් චෝදනා ගොනු නොකොට රඳවා තබා ගැනීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.
4. මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධද ඇතුළුව රාජ්‍ය නිලධාරීන් හා ආරක්ෂක අංශ සාමාජිකයන් විත්තිකරුවන් වී ඇති නඩු ඉවත් කර ගැනීම සඳහා වන යෝජනාවක් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීම.
5. අන්තර්ජාලය හරහා සිදු කරන අසත්‍ය සහ නොමග යවනසුලු ප්‍රකාශවලින් ආරක්ෂා වීම පිණිස අවශ්‍ය

නීති පැනවිය යුතු බවට අධිකරණ හා ජනමාධ්‍ය විෂය භාර ඇමතිවරුන් ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමි වීම.

6. ෆෙස්බුක් පළ කිරීම් මගින් ජනාධිපතිවරයා විවේචනය කළැයි රජයේ සේවකයන් දෙදෙනකුට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කිරීම සහ ස්ථාන මාරුවීම් ලබා දීම.

7. සතොස මගින් අවුරුදු සමයේ ලබාදෙන බඩුමල්ලේ අන්තර්ගත ද්‍රව්‍යවල ප්‍රමිතිය විවේචනය කළ ආපනශාලා හිමියන්ගේ සංගමයේ ජාතික සංවිධායක අසේල සම්පත්, පැරණි නඩුවකට අදාළව අත්අඩංගුවට ගැනීම.

8. අපරාධ සහ දූෂණ චෝදනා ලැබූ හමුදා සහ ඉහළ පෙළේ රජයේ නිලධාරීන්ට එරෙහි නඩු විභාග නතර කිරීමට ඉදිරිපත් කර ඇති යෝජනාව ප්‍රතික්ෂේප කරන ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටීම.

9. පුහු රථ පෙළකට ඉඩ සැලසීම සඳහා බොරැල්ලේ මාර්ගයක රථවාහන ගමනාගමනය නතර කිරීමට විරෝධය පළ කරමින් වාහනවල නළා ශබ්ද කරන ලෙස ඉල්ලා සිටි තරුණයකු පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම.

**වගු අංක: 01 වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 අප්‍රේල්**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 01 |
| 02 | නීතිමය කොන්දේසි | 08 |
| | **එකතුව** | **09** |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ අත්‍යවශ්‍ය සාධකයකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. මෙම මූලික නිදහසට අභියෝග එල්ල වූ එක් සිදුවීමක් අප්‍රේල් මාසය තුළ නිරීක්ෂණය විය.**

**වගු අංක: 02 - 2021 අප්‍රේල්: මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 01**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශාරීරික හිංසනය | 01 |
| | **එකතුව** | **01** |

## මාසය තුළ නව සිදුවීම්:

01. **උද්ඝෝෂණයක් වාර්තා කරමින් සිටියදී නිදහස් මාධ්‍යවේදී මලික අබේකෝන් අත්අඩංගුවට ගැනීම හා අත්අඩංගුවේ සිටියදී පහරදීම**

2021-04-07 දින කොළඹ ජාතික රෝහල අසල පැවති සෞඛ්‍ය සේවක උද්ඝෝෂණයක ඡායාරූප ගනිමින් සිටියදී නිදහස් මාධ්‍යවේදියකු හා ඡායාරූප ශිල්පියකු වන මලික අබේකෝන් මරදාන පොලිසිය විසින් අත්අඩංගුවට ගැනිණි. ඔහු පෙරටුගාමී සමාජවාදී පක්ෂයෙහි ක්‍රියාකාරිකයකුද වන අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හිටපු ශිෂ්‍ය නායකයකි.

අත්අඩංගුවට ගෙන පොලිස් ජීප් රථයෙන් රැගෙන යන අතරතුර හා ඉන් පසුව පොලිස් ස්ථානය තුළ දී ඔහුට පහර දී ඇති අතර, පොලිස් අත්අඩංගුවේ සිටියදී ඔහු බැලීමට ගිය නීතිඥවරයකුට හා හිතවතුන්ට පොලිසිය මුල් අවස්ථාවේදී බාධා කර තිබේ. පහරදීමට ලක්ව සිටි මාධ්‍යවේදියා වෛද්‍යවරයකු හමුවට ඉදිරිපත් කරන ලෙස කළ ඉල්ලීමද පොලිසිය විසින් ප්‍රතික්ෂේප කර තිබේ. මලික අබේකෝන්ට පහරදීමක් සිදුව නොමැති බවට

වෛද්‍ය වාර්තාවක් ද සමඟ පොලිසියේ රාජකාරියට බාධා කිරීමේ චෝදනාව මත අප්‍රේල් මස 08 වැනිදා ඔහුව මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කෙරිණි. වින්දිතයාගේ පාර්ශ්වයෙන් මතු කළ විරෝධතා හමුවේ බන්ධනාගාර වෛද්‍ය නිලධාරිවරයා මගින් යළිත් වෛද්‍ය වාර්තාවක් කැඳවීමට නියෝග කළ මහේස්ත්‍රාත්වරයා මලික අබේකෝන් අප්‍රේල් මස 12 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කළේය. 12 වැනිදා ඔහු ඇප මත මුදාහැරිණි.

මෙම සිදුවීම දැඩි ලෙස හෙළාදකිමින් නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ඒ පිළිබඳ විධිමත් හා අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වා ඊට වගකිවයුත්තන්ට එරෙහිව පියවර ගන්නා ලෙසත්, මාධ්‍යවේදියා වහා නිදහස් කරන ලෙසත් අවධාරණය කළේය. (නිවේදනය: https://bit.ly/3b2Hgv8) මලික අත්අඩංගුවට ගැනීමට හා ඔහුට පහරදීමට එරෙහිව 08 වැනිදා සෞඛ්‍ය සේවකයින් විසින් ජාතික රෝහල ඉදිරිපිටදීද, පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ක්‍රියාකාරිකයින් විසින් මරදාන පොලිසිය ඉදිරිපිටදීද උද්ඝෝෂණ දෙකක් පවත්වන ලදි.

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 8ක් අප්‍රේල් මාසය තුළ නිරීක්ෂණය විය. එම සිදුවීම් නීතිමය ක්‍රියාමාර්ග, මාධ්‍යයට නීතිමය සීමාකිරීම්, නීති ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍යවේදීන් සම්බන්ධ සිදුවීම්වලදී දණ්ඩමුක්තිය යන උප ශීර්ෂවලට අයත් වේ.**

**වගු අංකඃ 03 - අප්‍රේල්ඃ නීතිමය කොන්දේසි - සිදුවීම් 08**

| අංකය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 04 |
| 02 | මාධ්‍යයට නීතිමය සීමාකිරීම් | 01 |
| 03 | නීති ප්‍රතිසංස්කරණ යෝජනා | 01 |
| 04 | ජනමාධ්‍යවේදීන් සම්බන්ධ සිදුවීම්වලදී දණ්ඩමුක්තිය | 02 |
| | **එකතුව** | **08** |

## මාසය තුළ නව සිදුවීම්ඃ

01. **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම්වල කටයුතු ආවරණය කිරීමට ජනමාධ්‍යවේදීන්ට තිබූ අයිතිය චක්‍රලේඛයක් මගින් අහිමි කිරීම**

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් නව චක්‍රෙල්ඛයක් රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ අත්සනින් යුතුව නිකුත් කර ඇත. අංක 2/2021 දරන මෙම චක්‍රලේඛය මගින්, එතෙක් අදාළ රැස්වීම් වාර්තාකරණය සඳහා ජනමාධ්‍යවලට තිබූ අවස්ථාව අහිමි කර තිබේ.

මෙම රැස්වීම්වල කරුණු වාර්තා කිරීමට මාධ්‍යවේදීන්ට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම අවසානයේ එම කමිටුවල සභාපතිවරයා හා මහජන නියෝජිතයින් සමග වෙන වෙනම සාකච්ඡා පැවැත්විය හැකි යැයි එම චක්‍රලේඛයේ සඳහන් කර තිබේ.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම පිළිබඳව මීට ඉහතදී බලපැවැත්වූ, ස්වදේශකටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කළ 2017-05-22 දිනැති, 6/2017 දරන චක්‍රලේඛයේ. 25, 26 ඡේදවල අදාළ රැස්වීම් මාධ්‍යවේදීන්ට විවෘත බව පැහැදිලිව සඳහන් කර තිබූ අතර මාධ්‍යවේදීන්ට අවශ්‍යකරන පහසුකම් සැපයීමේ වගකීම අදාළ ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වගකීමක් බවද සඳහන් කර තිබිණි.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම්, ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතු හා රජයේ තීරණ තීන්දු පිළිබඳව මාධ්‍යවලට තොරතුරු ලැබෙන ප්‍රධාන මූලාශ්‍රයක් වන අතර එම රැස්වීම් ආවරණය කිරීම ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ රාජකාරි කටයුතුවල ප්‍රමුඛ වැදගත්කමක්

දැරුෑ අවස්ථාවක් විය. මෙම චක්‍රලේඛනයෙන් එම තොරතුරු ලබාගැනීමේ මාර්ගය අවහිර කර තිබේ. තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කර ඇති පසුබිමක මෙම චක්‍රලේඛය යළි අතීතයට ගමන් කිරීමකි.

2021 අප්‍රේල් 04 වැනිදා ලංකාදීප වෙබ් අඩවිය මේ පිළිබඳව ජනමාධ්‍ය ඇමතිවරයාගෙන් කළ විමසීමේදී, ඔහු ප්‍රකාශ කර ඇත්තේ ඒ පිළිබඳව දැනුවත්ව නොමැති බවයි. (මූලාශ්‍රය: https://bit.ly/3x5WFnH)

මාතලේ ශ්‍රී ලංකා පත්‍ර කලාවේදීන්ගේ සංගමය විසින්, ඉහත චක්‍රලේඛයෙන් මාධ්‍යයට පනවා ඇති සීමාව පිළිබඳව විරෝධය පළ කරමින් 20211-04-07 දාතමින් ජනමාධ්‍ය ඇමතිවරයාට ලිපියක් යොමු කර ඇත.

02. **දෙමළ භාෂා ගුරුවරයකු හා කවියකු වන මුහම්මදු අහ්නාෆ් මුහම්මදු ජසීම් ත්‍රස්ත විමර්ශන අංශය මගින් අත්අඩංගුවට ගෙන වසරකට ආසන්න කාලයක් චෝදනා ගොනු නොකොට රඳවා තබා ගැනීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

මුහම්මදු අහ්නාෆ් මුහම්මදු ජසීම් 2020 මැයි 16 වැනිදා ත්‍රස්ත විමර්ශන අංශය මගින් අත්අඩංගුවට ගෙන මේ දක්වා අධිකරණය ඉදිරියේ චෝදනා ගොනු කිරීමකින් තොරව රඳවා තබා ගැනීමට එරෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් අප්‍රේල් 10 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කෙරිණි.

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරල් කමල් ගුණරත්න, පොලිස්පති, CTID අධ්‍යක්ෂ ප්‍රසන්න ද අල්විස්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ වව්නියා ඒකකයේ පොලිස් පරීක්ෂක කේ.කේ.ජේ. අනුර ශාන්ත සහ නීතිපතිවරයා නම් කොට තිබේ.

අහ්නාෆ් රඳවා තබාගැනීම සඳහා 2020 මැයි 19 වැනිදා නිකුත් කළ නියෝගය මෙම පෙත්සම මගින් අභියෝග යට ලක් කර ඇති බවත්, අහ්නාෆ් අත්අඩංගුවේ සිටියදී වධහිංසාවලට ලක් කිරීම, ඔහුට එරෙහිව ගොතන ලද චෝදනා පිළිගන්නා ලෙස බලපෑම් කිරීම යනාදී කරුණු පෙත්සමෙහි සඳහන් වන බවත් නීතිඥ සංජය විල්සන් ජයසේකර උපුටා දක්වමින් JDS වෙබ් අඩවිය සඳහන් කරයි. (මූලාශ්‍ර 1. https://bit.ly/3eE4FnN

03. **මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධද ඇතුළුව රාජ්‍ය නිලධාරීන් හා ආරක්ෂක අංශ සාමාජිකයන් විත්තිකරුවන් වන නඩු ඉවත් කර ගැනීම සඳහා අගමැතිවරයා විසින් ඉදිරිපත් කරන යෝජනාවක් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කිරීම.**

ජනාධිපතිවරයා විසින් පත් කළ දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසමේ (උපාලි අබේරත්න කොමිසම) නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු බවට අගමැතිවරයා විසින් ඉදිරිපත් කරන යෝජනාවක් අප්‍රේල් 21 වැනිදා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කර තිබිණි.

මේ පිළිබඳව ජාතික ජන බලවේගයේ අනුර කුමාර දිසානායක සහ සමගි ජන බලවේගයේ එරාන් වික්‍රමරත්න යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ප්‍රවෘත්ති සාකච්ඡා දෙකකදී ප්‍රකාශ කළ පරිදි, හමුදා නිලධාරීන් හා වෙනත් රජයේ නිලධාරී චූදිතයන් වන නඩු 70 ගණනක් ඉවත් කර ගැනීමට කොමිසම නිර්දේශ කර ඇත. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන සමයෙහි ජනමාධ්‍යවේදීන්ට එරෙහිව සිදු වූ, ලසන්ත වික්‍රමතුංග ඝාතනය, කීත් නොයාර් පැහැරගෙන යෑම සහ පහරදීම, උපාලි තෙන්නකෝන්ට පහරදීම, ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් අතුරුදන් කිරීම යන අපරාධ සම්බන්ධ නඩුද ඒ අතර වෙයි. (මූලාශ්‍රය: https://youtu.be/_Hlokzwft3Y) මෙම නඩු ඉවත් කර ගැනීමට කොමිසම නිර්දේශ කර ඇත්තේ, ආරක්ෂක අංශවල සාමාජිකයන් එම නඩුවල විත්තිකරුවන් වීම හේතුවෙනි.

මේ අතර අදාළ කොමිසමේ අවසන් වාර්තාව සභාව කල්තැබීමේ යෝජනාවක් ලෙස අප්‍රේල් 22 හා 23 දිනවල විවාදයට ගැනුණු අතර එහිදී අදාළ නිර්දේශ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ තදබල විවේචනයට ලක් විය.

04. **අන්තර්ජාලය හරහා සිදු කරන අසත්‍ය සහ නොමග යවනසුලු ප්‍රකාශවලින් ආරක්ෂා වීම පිණිස අවශ්‍ය නීති පැනවීම**

අන්තර්ජාලය හරහා සිදු කරන අසත්‍ය සහ නොමග යවනසුලු ප්‍රකාශවලින් ආරක්ෂා වීම පිණිස අවශ්‍ය නීති පැනවිය යුතු බවට අධිකරණ හා ජනමාධ්‍ය විෂය භාර ඇමතිවරුන් ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමි වී තිබේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් අප්‍රෙල් 19 වැනිදා නිකුත් කළ අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ මාධ්‍ය ප්‍රකාශයෙහි, අදාළ නීති පැනවීමේ අරමුණු මෙසේ සඳහන් වේ.

"අන්තර්ජාලය මඟින් අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීම බරපතළ තර්ජනයක් නිර්මාණය කරන අතර, එම තත්ත්වය සමාජය බෙදීමට, වෛරය පැතිරවීමට සහ ප්‍රජාතාන්ත්‍රික ආයතන දුර්වල කිරීමට යොදා ගනු ලබන බව පෙනී ගොස් ඇත. මෙම ගැටලුව විසඳීම සඳහා විවිධ රටවල් විසින් නීති පැනවීමට මේ වන විටත් අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. අන්තර්ජාලය ඔස්සේ සිදු කරන අසත්‍ය ප්‍රචාර හේතුවෙන් සිදු වන හානි වලින් සමාජය ආරක්ෂා කිරීම උදෙසා නව නීතියක් හඳුන්වා දීම මඟින් පුරවැසියන්ට හා සිවිල් සමාජයට නිවැරදි තොරතුරුවලට ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දීම පිණිස පියවර ගත යුතුව ඇත. ඒ අනුව, අදාළ කාර්යය සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි. (මූලාශ්‍රය: https://sinhala.dgi.gov.lk/cabinet-decisions-sri-lanka)

ජනමාධ්‍ය ඇමතිවරයා සහ අධිකරණ ඇමතිවරයා විසින් මෙවැනි නව නීති පැනවීමේ අවශ්‍යතාව පිළිබඳව වරින් වර ජනමාධ්‍යවලට අදහස් පළ කර තිබූ අතර මෙම යෝජනාව එම අදහස් ක්‍රියාවට නැංවීමක් බව පැහැදිලි වේ. අප්‍රේල් 19 වැනිදා ඩේලි මිරර් වෙබ් අඩවිය වාර්තා කළ පරිදි, "ජාතික ආරක්ෂාව, ප්‍රජාවන් අතර සමඟිය සහතික කිරීමත් මහජනතාවගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමත් සංවර්ධන වැඩසටහන් පිළිබඳ වැරදි තොරතුරු පැතිරීම අධෛර්යමත් කිරීමත්" යෝජිත නව නීතිවල අරමුණ බව අධිකරණ ඇමති අලි සබ්රි, යෝජිත වරාය නගර කොමිෂන් සභා කෙටුම්පත පිළිබඳ ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇත. (මූලාශ්‍රය: https://bit.ly/3tzbq05)

අදාළ කැබිනට් මණ්ඩල තීරණය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සහ මාධ්‍ය නිදහසට ඉතාමත් අහිතකර එකක් විය හැකි බවට අනතුරු අඟවමින් හා එම තීරණය ගැන අප්‍රසාදය පළ කරමින් නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, නියාමනය වෙනුවට රජයක් මැදිහත් වී මර්දනකාරී නීති ගෙන ඒමෙන් සිදු වන්නේ බලධාරීන්ට අවශ්‍ය ආකාරයට 'අසත්‍ය පුවත්' යන්න අර්ථකතනය කර මාධ්‍ය මර්දනයට හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීමට ඉඩ සැලසීමක් බව අවධාරණය කළේය. (නිවේදනය: https://bit.ly/3b2xLft)

05. **ෆේස්බුක් පළ කිරීම් මගින් ජනාධිපතිවරයා විවේචනය කළැයි රජයේ සේවකයන් දෙදෙනකුට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කිරීම සහ ස්ථාන මාරුවීම් ලබා දීම.**

ෆේස්බුක් සමාජජාලයේ සිදු කළ පළකිරීම් මගින් ජනාධිපතිවරයා විවේචනය කිරීමේ චෝදනාව මත ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ දිස්ත්‍රික් කාර්යාල සඳහා අනුයුක්ත කොට ඇති සේවකයන් දෙදෙනෙකුට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කර ඇති අතර ඔවුන් තාවකාලිකව වෙනත් සේවා ස්ථානවලට මාරු කර යවා තිබේ.

වාහන නියාමනය, බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ ප්‍රවාහන කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියගේ අත්සනින් යුතු 202.03.29 දරන ලිපිය මගින් කළ දැනුම් දීම මත ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සභාපති වෛද්‍ය සවින්ද්‍ර ගමගේගේ නියෝගය පරිදි මෙම මාරුවීම් සිදු කොට ඇත.

මේ පිළිබඳව දෙමළ ජාතික සංධානයේ පා.ම. ශානක්කියන් රාසමාණික්කම් විසින් පාර්ලිමේන්තුවේදී ගාමිණී ලොකුගේ අමාත්‍යවරයාගෙන් ප්‍රශ්න කළ අතර එහිදී ඇමතිවරයා පැවසුවේ එය රාජ්‍ය අමාත්‍යාංශයට අයිති නමුත් තමන් විසින්ද ඒ පිළිබඳ වාර්තාවක් කැඳවා ඇති බවයි. (මූලාශ්‍රය: https://bit.ly/3v2byWo)

සමාජමාධ්‍ය ඔස්සේ කළ විවිධ පළකිරීම් හේතුවෙන් පුද්ගලයන්ට එරෙහි නීතිමය පියවර ගැනීමේ සිදුවීම් මෑත වකවානුවෙහි බහුල වශයෙන් වාර්තා වූ නමුත් 'ජනාධිපතිවරයා විවේචනය කිරීම' සම්බන්ධයෙන් ආයතන මට්ටමින් විනය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව වාර්තා වූ පළමු අවස්ථාව මෙය වේ.

06. **සතොස මගින් අවුරුදු සමයේ ලබාදෙන බඩුමල්ලේ අන්තර්ගත ද්‍රව්‍යවල ප්‍රමිතිය විවේචනය කළ ආපනශාලා හිමියන්ගේ සංගමයේ ජාතික සංවිධායක අසේල සම්පත්, පැරණි නඩුවකට අදාළව අත්අඩංගුවට ගැනීම**

අවුරුදු උත්සව සමයේ පාරිභෝගිකයන්ට සහනයක් ලෙස, වෙළෙඳ අමාත්‍යවරයාගේ මැදිහත්වීම මත සතොස ආයතනය මගින් රු. දහසක මිලකට බඩු මල්ලක් ලබා දුන් අතර ආපනශාලා හිමියන්ගේ සංගමයේ ජාතික සංවිධායක අසේල සම්පත් ප්‍රවෘත්ති සාකච්ඡාවකදී එම බඩු මල්ලේ ප්‍රමිතිය දැඩි විවේචනයට ලක් කළේය. (මූලාශ්‍රය: https://bit.ly/3dXya4P)

අප්‍රේල් 12 වැනිදා පැවති මෙම ප්‍රවෘත්ති සාකච්ඡාවෙන් පසුව අප්‍රේල් 13 වැනිදා කොම්පඤ්ඤවීදිය පොලිසිය විසින් ඔහු අත්අඩංගුවට ගැනුණු අතර අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අප්‍රියෙල් 19 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. අප්‍රියෙල් 19 වැනිදා කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් ඔහු ඇප මත මුදාහරින ලදි.

අසේල සම්පත් අත්අඩංගුවට ගැනීම හා ඔහු කළ විවේචනය අතර සම්බන්ධයක් නැති බවත්, ඔහු අත්අඩංගුවට ගෙන ඇත්තේ ඔහුට එරෙහිව අධිකරණයේ විභාගවෙමින් පැවති වෙනත් නඩුවකට පෙනී නොසිටීම හේතුවෙන් නිකුත් කළ වරෙන්තුවකට අනුව බවත් රජය පාර්ශ්වයෙන් කියා සිටී. නමුත් අසේල සම්පත් නියෝජනය කරන ජන බල පවුර සංවිධානය තරයේ කියා සිටියේ විවේචනය හේතුවෙන් එම අත්අඩංගුවට ගැනීම සිදු කළ බවයි. අසේල සම්පත්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නීතිඥ සේනක පෙරේරා ප්‍රකාශ කරන්නේ, පැරණි වරෙන්තුව ක්‍රියාත්මක කිරීමට අමතරව සතොස බඩු මල්ල විවේචනය කිරීමෙන් රජය අපහසුතාවට පත් කිරීම හා එම විවේචනය නිසා සතොස ආයතනයේ අලෙවිය අඩාළ කිරීම සම්බන්ධයෙන් අසේල සම්පත්ට එරෙහිව වෙනම චෝදනා ගොනු කර ඇති බවයි.

මේ පිළිබඳව වෙළඳ ඇමති බන්දුල ගුණවර්ධන විසින් අප්‍රේල් 23 වැනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළ අතර බඩු මල්ල පිළිබඳව අසේල සම්පත් කළ චෝදනා තරයේ ප්‍රතික්ෂේප කළේය. ඔහු විසින් ඉදිරිපත් කළ චෝදනා සම්බන්ධයෙන් සතොස සභාපතිවරයා, දාස සමූහ ව්‍යාපාරය සහ අදාළ තේ සැපයුම්කරු විසින් අසේල සම්පත්ට එරෙහිව පොලිසියට පැමිණිලි කර ඇති බවද, තමන්ට සිදු කළ අපහාසය වෙනුවෙන් නීතිමය පියවර ගැනීමට සිය නීතිඥයන්ට දැනුම් දී ඇති බවද ඇමතිවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය. (මූලාශ්‍රය: https://bit.ly/3u0SIyG)

මෙම සිදුවීමේ පසුබිම විවාදාපන්න වන නමුත් වත්මන් රජය විවේචනය කිරීම සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රවණතාවක් එමගින් පෙන්නුම් කරයි.

07. **අපරාධ සහ දූෂණ චෝදනා ලැබූ හමුදා සහ ඉහළ පෙළේ රජයේ නිලධාරීන්ට එරෙහි නඩු විභාග නතර කිරීමට ඉදිරිපත් කර ඇති යෝජනාව ප්‍රතික්ෂේප කරන ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටීම.**

දේශපාලන පළිගැනීම් පිළිබඳව සොයා බැලීමට ජනාධිපතිවරයා විසින් පත් කළ කොමිසමේ නිර්දේශ අනුව, අපරාධ සහ දූෂණ චෝදනා ලැබූ හමුදා සහ ඉහළ පෙළේ රජයේ නිලධාරීන්ට එරෙහි නඩු විභාග නතර කිරීම සඳහා ඉදිරිපත්ව ඇති යෝජනාව ප්‍රතික්ෂේප කරන ලෙස ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටී.

2021-04-23 වැනිදා නිකුත් කළ නිවේදනයක් මගින් ඒ පිළිබඳව අදහස් පළ කරන එම සංවිධානය, අදාළ කොමිසමේ වාර්තාව "අධිකරණයේ ස්වාධීනත්වයට හා නීතියේ ආධිපත්‍යයට කරන නිග්‍රහයක්" ලෙස පුළුල් ලෙස අපකීර්තියට පත්ව ඇති අතර එය මහජනයාට ලබා ගත නොහැකි බවද සඳහන් කරයි.

සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය, මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සහ මාධ්‍යවේදී කීත් නොයාර් පැහැර ගැනීම ඇතුළු අපරාධවලට සම්බන්ධ නඩුද ඉවත් කර ගැනීමට කොමිසම යෝජනා කර ඇති බවද සාක්ෂි "ගොතන ලද" බවට සහ දූෂණ ක්‍රියාවල නිරත වීමේ චෝදනා මත එම නඩුවලට සම්බන්ධ විමර්ශකයින්, නීතිඥයින් සහ නඩු පැවරූ නිලධාරීන්ට එරෙහිවද නඩු පවරන ලෙස අදාළ කොමිසම නිර්දේශ කර ඇති බව එම නිවේදනයෙන් පෙන්වා දී ඇත.

මෙය "නීති වෘත්තිකයින්ට සහ නඩු පවරන්නන්ට ඔවුන්ගේ වෘත්තීය හා ව්‍යවස්ථාපිත රාජකාරී ඉටු කිරීම සම්බන්ධයෙන් පියවර ගැනීම නිදහස් හා ස්වාධීන අධිකරණයකට එල්ල කරන පූර්ණ ප්‍රහාරයක් වන අතර මෙම නිර්දේශය මුළුමනින් ප්‍රතික්ෂේප කළ යුතු" බවද වැඩිදුරටත් අවධාරණය කරයි.

මෙමගින් අධිකරණ තීන්දු සහ අධිකරණ කටයුතු අධිකරණ ව්‍යුහයෙන් පිටත නැවත තක්සේරු කර ඇති බැවින් අධිකරණයේ ස්වාධීන ක්‍රියාකාරීත්වයට බාධාවක් වන බවත් බලතල බෙදීමේ මූලධර්මය උල්ලංඝනය වන බවත් එම නිවේදනය තවදුරටත් සඳහන් කරයි. (මූලාශ්‍රය: https://bit.ly/3esqmac)

08. **ප්‍රභූ රථ පෙළකට ඉඩ සැලසීම සඳහා බොරැල්ලේ මාර්ගයකය රථවාහන ගමනාගමනය නතර කිරීමට විරෝධය පළ කරමින් වාහනවල නළා ශබ්ද කරන ලෙස ඉල්ලා සිටි තරුණයකු පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම.**

අප්‍රේල් 27 වැනිදා රාත්‍රියේ චීන විදේශ ඇමතිවරයා රැගත් ප්‍රභූ රථ පෙළට ඉඩ සැලසීම සඳහා බොරැල්ලේ ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත වසා දැමීමට විරෝධය දැක්වීම සඳහා වාහනවල නළාව ශබ්ද කරන ලෙස අන් රියදුරන් ගෙන් ඉල්ලා සිටි තරුණයකු 29 වැනිදා බොරැල්ල පොලිසිය විසින් අත්අඩංගුවට ගැනිණි. 31 හැවිරිදි, නවීන් මාධව නැමති ඔහු බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක නි. පොලිස්පති අජිත් රෝහණ ප්‍රකාශ කළ ආකාරයට ඔහු අත්අඩංගුවට ගෙන ඇත්තේ පොලිස් රාජකාරියට බාධා කිරීම හා නීති විරෝධී රැස්වීමක් සංවිධානය කිරීම යන චෝදනා යටතේය. (මූලාශ්‍රය: https://bit.ly/2PJgwZf)

30 වැනිදා කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කෙරුණු ඔහු, ඇප මත මුදාහැරුණු අතර නඩුව මැයි 12 වැනිදාට කල් තබන ලදි. ඇප ලැබීමෙන් පසු මාධ්‍යයට ප්‍රකාශයක් කළ නවීන් මාධව, තමන් අතින් වරදක් සිදු වූ බවත් ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා රජයෙන් හා පොලිසියෙන් සමාව ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කළේය. ඔහුට සමාව ගැනීමට කිසිවකු විසින් බල කළේදැයි මාධ්‍යවේදියකු ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දීම ඔහු ප්‍රතික්ෂේප කළේය. (මූලාශ්‍රය: https://bit.ly/33bQ25z)

අදාළ සිදුවීම එම තරුණයා විසින්ම සිය ජංගම දුරකථනයෙන් වීඩියෝගත කර සමාජමාධ්‍යයෙහි පළ කරන ලදුව විශාල වශයෙන් සංසරණය විය. එම තරුණයා, පාර වසා තිබෙන්නේ ඇයිදැයි පොලිස් නිලධාරීන්ගෙන් විමසන අයුරුත්, එය ප්‍රභූ ආරක්ෂාව සඳහා ගත් පියවරක් බව දැනුම් දීමෙන් පසු මාර්ගයේ වාහන නවතාගෙන සිටි රියදුරන් ආමන්ත්‍රණය කරමින් ඊට අකමැත්ත පළ කිරීම සඳහා වාහනවල නළා නාද කරන ලෙස ඉල්ලා සිටින අයුරුත් එම වීඩියෝවේ සටහන්ව තිබිණි. (මූලාශ්‍රය: https://bit.ly/2ShqUrT)

තරුණයා අත්අඩංගුවට ගැනීමෙන් පසු ඒ පිළිබඳව මාධ්‍ය ඔස්සේ දැඩි ලෙස සාකච්ඡාවට ලක් වූ අතර එය 'සාමකාමී විරෝධයට ඇති අයිතිය අහිමි කිරීම භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය අහිමි කිරීමක්' බව අවධාරණය කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුව විසින් නිවේදනයක් නිකුත් කෙරිණි. (නිවේදනය: https://bit.ly/3xHE2XP)

යම් ක්‍රියාවකට එරෙහිව තම විරෝධය දැක්වීමට ඕනෑම පුරවැසියකුට අයිතිය ඇති බව මීට පෙර ද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු ගණනාවකින්ම පිළිගෙන තිබෙන බව අවධාරණය කරන එම නිවේදනය, නළා නාද කරමින් විරෝධතා දැක්වීම ද භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතියේම කොටසක් බව සුප්‍රකට ජනඝෝෂා නඩුවේ (264 SLR (1993) 1) තීන්දුවෙන් පිළිගෙන තිබෙන බවද සිහිපත් කරයි.

**වගු අංකः 03 - මාධ්‍ය නිදහසः 2021 ජනවාරි- අප්‍රේල් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම් සංඛ්‍යාව**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - මාර්තු | 2021 අප්‍රේල් |
|---|---|---|
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 13 | 01 |
| නීතිමය කොන්දේසි | 14 | 08 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 01 | |
| එකතුව | **28** | **09** |

මාධ්‍ය නිදහස නිරීක්ෂණ වාර්තා - 2021 ජනවාරි සිට මාර්තු දක්වා

**පසුසටහනः** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙළ කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25